# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2060/23 - 2018 පෙබරවාරි මස 28 වැනි බදාදා - 2018.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මැතිවරණ කොමිෂන් සභාව**

මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2018 පෙබරවාරි 10**

2018 පෙබරවාරි 10 දින පවත්වනු ලැබූ පළාත් පාලන ආයතන 340 ක ඡන්ද විමසීමේ දී ඒ ඒ පළාත් පාලන ආයතනයට තරග කළ ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂ හා ඒ ඒ ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂයට/ස්වාධීන කණ්ඩායමට කොට්ඨාස මට්ටමින් හිමි වූ, සභික ධූර සංඛ්‍යාව හා ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂයට/ස්වාධීන කණ්ඩායමට හිමි වූ මුළු සභික ධූර සංඛ්‍යාව සඳහන් කරමින් ඒ ඒ පළාත් පාලන ආයතනවල තේරීම් භාර නිලධාරීන් විසින් නිකුත් කළ ප්‍රතිඵල වාර්තා ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල, අදාළ පළාත් පාලන ආයතන කාර්යාලවල සහ මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති බව මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

මෙම ප්‍රතිඵල ඒ ඒ දේශපාලන පක්ෂ වෙත හා ස්වාධීන කණ්ඩායම් වෙත ද නිකුත් කර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

එන්. ජේ. අබේසේකර
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

එස්. රත්නජීවන් එච්. හූල්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

2018 පෙබරවාරි මස 28 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

03 - 1074